සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය

රැකියා පුරප්පාඩු

සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය මෙරට ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට සහාය දැක්වීම සඳහා ශ්‍රී ලංකා රජය හා ප්‍රමුඛ පෙළ මුල්‍ය ආයතන 13ක් එක්ව ස්ථාපිත කර ඇති රාජ්‍ය පෞද්ගලික හවුල්කරිත්වයක් සහිත ආයතනයකි. මෙම ආයතනය සහභාගිත්ව මුල්‍ය ආයතන සඳහා ණය ඇපකර සපයන අතර ආර්ථික වර්ධනය සහ සමෘධිය ප්‍රවර්ධනය කරන ශක්‍ය ව්‍යාපෘතීන් සඳහා මුදල් ප්‍රවාහ මත පදනම් කරගත් ණය ලබාදීම ප්‍රවර්ධනය කරයි.

අප සොයන්නේ කැපවූ, ශක්තිමත් සන්නිවේදන කුසලතා ඇති, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය පද්ධතිය පිළිබඳ මනා දැනුමක් ඇති, සවිස්තරාත්මකව අවධානය යොමු කිරීමට හැකියාව ඇති සහ ඉහළ කාර්ය සාධනයක් සහ කණ්ඩායම් සාමාජිකයින් සමග ඉලක්ක සපුරා ගැනීමේ හැකියාව ඇති පුද්ගලයන්ය.

ඔබ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ වර්ධනයට බලපෑමක් ඇති කිරීමට හැකි අපේක්ෂකයෙක් නම්, අප හා එක්වන්න!

ප්‍රධාන සුදුසුකම්, පළපුරුද්ද සහ වගකීම්

අවදානම් කළමනාකරණ ප්‍රධානී / ප්‍රධාන අවදානම් නිලධාරී

අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ අරමුණු සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා උපායමාර්ගික නායකත්වය ලබාදීම මෙම තනතුරේ ප්‍රධාන වගකීම වේ.
එමෙන්ම, NCGIL ආයතනයේ ඇපකර කළඹ (Guarantee Portfolio) මෙහෙයුම් සමාලෝචනය කිරීම, ආයෝජන කළඹේ අවදානම හා ලාභදායීතාව ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීම සහ ආයතනයේ සමස්ත මෙහෙයුම් තුළ පවතින අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම ද මෙම තනතුරට අයත් වේ.

***මෙම තනතුර වසර තුනක කොන්ත්‍රාත් පදනම් මත බඳවා ගනු ලබන අතර, කාර්යසාධනය මත කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරනු ලැබේ.**

- මූල්‍ය, ගිණුම්කරණ, ආර්ථික විද්‍යා, ව්‍යාපාර පරිපාලන, විද්‍යා හෝ ඊට අදාළ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක් ලබා තිබීම.
- එසේ නොමැති නම් CA, CIMA, ACCA, CMA, DBF හෝ ඊට සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම.
- මූල්‍ය, ගිණුම්කරණ, ආර්ථික විද්‍යා, ව්‍යාපාර පරිපාලන, විද්‍යා හෝ ඊට අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.
- බැංකු හෝ මූල්‍ය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10ක පළපුරුද්දක් තිබිය යුතු අතර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය ලබාදීම පිළිබඳ අත්දැකීම් සහ ණය අවදානම් කළමනාකරණය පිළිබඳ ප්‍රායෝගික පළපුරුද්දක් තිබිය යුතුය. එසේම සාම්ප්‍රදායික ණය අවදානම් කළමනාකරණ මූලධර්ම හා භාවිතයන් පිළිබඳ දැනුම සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ හැකියාව තිබිය යුතුය
- වයස අවුරුදු 40 – 57 අතර වීම වඩාත් යෝග්‍ය වේ.

විධායක - ඇපකර පරිපාලන

ඇපකර පරිපාලන ක්‍රියාවලිය පහසු කිරීම මෙම තනතුරේ ප්‍රධාන වගකීම වේ. ඒ යටතේ මූලික ණය විශ්ලේෂණ කටයුතු සිදු කිරීම, ණය කළඹ යාවත්කාලීන කිරීම, ණය ගැනියන්ගේ තොරතුරු ලබා ගැනීම සඳහා කොටස් හිමි මූල්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම, ණය ගැනියන් ලියාපදිංචි කිරීම, වාර්තා පවත්වාගෙන යාම සහ ඊට අදාළ අනෙකුත් කාර්යයන් සිදු කිරීම ඇතුළත් වේ.

*** මෙය ස්ථිර පූර්ණකාලීන තනතුරකි**

- මූල්‍ය, වාණිජ, ව්‍යාපාර පරිපාලන හෝ අදාළ ක්ෂේත්‍රයක පිළිගත් ආයතනයකින් ලබාගත් ප්‍රථම උපාධියක් හෝ ඊට සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම.
- බැංකු ක්ෂේත්‍රයට අදාළ වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අමතර වාසියක් ලෙස සැලකේ.
- සාමාන්‍ය බැංකු කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර 01 – 02ක පළපුරුද්දක් තිබිය යුතු අතර, බැංකුවක හෝ මූල්‍ය ආයතනයක ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය ලබාදීම පිළිබඳ පළපුරුද්දක් තිබීම වඩාත් යෝග්‍ය වේ.
- Microsoft Office මෘදුකාංග භාවිතය පිළිබඳ මනා දැනුමක් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) පිළිබඳ සාක්ෂරතාව අනිවාර්ය වේ.
- වයස අවුරුදු 25 – 40 අතර වීම වඩාත් යෝග්‍ය වේ

තෝරා ගැනීමේ ක්‍රියාවලිය

පරිපූර්ණ සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියක් තුලින් තෝරාගැනීම් සිදු කරනු ලබන අතර,සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන අයදුම්කරුවන්හට පමණක් එම තෝරාගනු ලබන ක්‍රියාවලි තුල සියලු අදියරවලදී දැනුම් දෙනු ලබන බව කරුණාවෙන් සලකන්න.

මේ සම්බන්ධව ඔබ කැමැත්තක් දක්වන්නේ නම්, හා අදාල අවශ්‍යතා සපුරාලිය හැකි නම්, කරුණාකර ඔබගේ සම්පූර්ණ ජීවදත්ත පත්‍රිකාව, PDF ආකෘතියෙන් ඳහා නොවන නිර්දේශිකයන් දෙදෙනකුගේ ඊමේල් ලිපි සමඟ මෙම දැන්වීම් පලවී දින 7 ඇතුළත careers@ncgil.lk වෙත යොමු කරන්න.

සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය
7 වන මහල,අංක 479, HNB ටවර්ස්, ටී.බී. ජයා මාවත, කොළඹ 10.